<u>වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී දෛනික විද්‍යාර්ථයින් සැලකිලිමත් විය යුතු කරුණු</u>

1. වෛද්‍ය සහතිකයේ පහත සදහන් විස්තර තිබිය යුතුය.
   - වෛද්‍ය නිලධාරියාගේ සුදුසුකම් හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය තිබිය යුතුය.
   - වෛද්‍ය මධ්‍යස්ථානය සම්බන්ධ කර ගත හැකි තොරතුරු සදහන් විය යුතුය. (ලිපිනය හා දුරකථන අංකය)
   - රෝග විනිශ්චය සහ වෛද්‍ය නිවාඩු ලෙස නිර්දේශිත දින ගණන නිශ්චිතව සදහන් විය යුතුය.
   - එය මුද්‍රිත වෛද්‍ය සහතිකයක් විය යුතුය.
   - රජයේ රෝහලක වෛද්‍ය සහතිකය නිකුත් කරනු ලබන්නේ සීමාවාසික පුහුණුව ලබන වෛද්‍යවරයෙකු නම් එම වාට්ටුවේ විශේෂඥ වෛද්‍යවරයාගේ රබර් මුද්‍රාව එහි අඩංගු විය යුතුය.

2. අසනීප වූ පලමු දිනයේදී ම විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය දැනුවත් කිරීම අනිවාර්ය වේ. (විභාග හා දේශන පැවැත්වෙන වේලාව අතරතුර විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානයට දුරකතන ඇමතුමක් ලබා දිය යුතුය (වෛද්‍ය මධ්‍යස්ථානය දුරකතන අංකය <u>0710219335</u>)

3. ලියාපදිංචි අංකය සහ ඔවුන් විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානයට ඇමතුමක් ගත් දිනය වෛද්‍ය සහතිකයේ ඉහල දකුණු පස කෙලවරේ සදහන් කර තිබිය යුතුය.

4. වෛද්‍ය අනුමත නිවාඩු අවසන් වූ දිනයේ සිට දින හතක් (07) ඇතුලත වෛද්‍ය සහතිකය පීඨයේ සහකාර ලේඛකාධිකාරිවරයාට භාර දිය යුතුය.

5. වෛද්‍ය අනුමත නිවාඩු අවසන් වූ දිනයේ සිට දින හතක් (07) ඇතුලත වෛද්‍ය සහතිකය භාර දීමට නොහැකි නම් සිසුන් එය පීඨය වෙත දැනුම් දී ඊමේල් පණිවිඩයක් මගින් වෛද්‍ය සහතිකය පීඨය වෙත යැවිය යුතුය.

6. විශ්වවිද්‍යාලය අවට වෛද්‍ය මධ්‍යස්ථාන වලින් ලබා ගන්නා සියලුම පුද්ගලික හා රජයේ වෛද්‍ය සහතික ප්‍රතික්ෂේප කිරීමට විශ්වවිද්‍යාලීය වෛද්‍ය මණ්ඩලය තීරණය කර ඇති බැවින් ප්‍රතිකාර ලබා ගන්නා සිසුන් අනිවාර්යෙන්ම විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය වෙත පැමිණිය යුතු බවත් වෛද්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

7. සිසුන් කතා කර ගැනීමට නොහැකි තරම් අසනීප තත්වයක පසුවන්නේ නම් මව හෝ පියා විසින් අසනීප වූ පලමු දිනයේදී ම විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය දැනුවත් කිරීම අනිවාර්ය වේ.

8. අසනීප තත්වයක් ඇතිවූ විට විශ්වවිද්‍යාලය අවට රැදී සිටින සියලුම සිසුන් විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානයට පැමිණිය යුතුය. එමෙන්ම විශ්වවිද්‍යාලය අවට රැදී සිටින සිසුන්ට යොමු අංකයක් (reference number) නිකුත් කිරීමක් සිදු නොවේ.

9. අසනීප වූ පලමු දිනය නිවාඩු දිනයක් හෝ රාත්‍රී කාලයේදී අසනීප වූයේ නම් ඊට පසු දින උදෑසන අනිවාර්යෙන්ම වෛද්‍ය මධ්‍යස්ථානය දැනුවත් කල යුතුය.

10. සෙනසුරාදා හෝ ඉරිදා දිනයේදී විභාග හෝ දේශන පැවැත්වෙනම් එදිනම විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය දැනුවත් කල යුතුය.

11. තවද වෛද්‍ය ප්‍රතිකාර සදහා පැමිණෙන සියලුම දෛනික විද්‍යාර්ථයින් කුඩා අභ්‍යාස පොතක් (පිටු 40) රැගෙන ආ යුතු වේ. ඔවුන් වෛද්‍ය ප්‍රතිකාර සදහා පැමිණෙන සෑම අවස්ථාවකදීම එම පොතම භාවිතා කල යුතු වේ. (වෛද්‍යවරයා විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය තුල රැදී සිටින වේලාව පෙ.ව 09.00 සිට ප.ව 15.30 දක්වා)

CamScanner